# විශ්වවිද්‍යාලය සතු භෞතික සහ මානව සම්පත්වලින් විද්‍යාර්ථයින් කොතෙක් දුරට ප්‍රයෝජන ගෙන තිබේද යන්න පිළිබඳ අධ්‍යනයක්. (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

**එච්. ටී. ඒ. ශාලික**[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ පවතින සෑම විශ්වවිද්‍යාලයකම පාහේ  විද්‍යාර්ථීන්ට ප්‍රයෝජනයට ගත හැකි පරිදි අතිවිශාල භෞතික සහ මානව සම්පත් ප්‍රමාණයක් පවතී. එහෙත් වර්තමානයේ බහුතරයක් විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින් මෙම සම්පත් නිසි පරිදි ප්‍රයෝජනයට නොගනී. විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපනික සහ බාහිර කටයුතු සඳහා මෙම සම්පත් යොදාගන්නේ නම් පවතින තත්ත්වයට වඩා විශ්වවිද්‍යාලය විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන සහ බාහිර කටයුතු සාර්ථක සහ පහසු වනු ඇත. විශ්වවිද්‍යාලයක් සතු භෞතික සහ මානව සම්පත් මොනවාද යන්න හඳුනාගැනීම, විද්‍යාර්ථීන් කොතෙක් දුරට විශ්වවිද්‍යාලය සතු සම්පත් පිළිබඳ දැනුවත්ද යන්න සහ විද්‍යාර්ථීන් එකී සම්පත් තම අධ්‍යන අවශ්‍යතා සඳහා කොතෙක් දුරට උපයෝජනය කරගෙන තිබේද යන්න ආදී අරමුණු  පදනම් කරගෙන මෙම අධ්‍යනය සිදුකරන ලදි. ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්  100 නියැදියක් ආශ්‍රයෙන් ප්‍රශ්න මාලා ක්‍රමය යොදාගෙන ප්‍රාථමික දත්ත රැස්කර ගන්නා ලදී. එසේම විශ්වවිද්‍යාලය සම්බන්ධව ඇති පොත් පත් සහ අන්තර්ජාලය හරහා පරීයේෂණය සඳහා අවශ්‍ය ද්විතීයික දත්තයන් රැස්කර ගන්නා ලදී. එම දත්තයන් සංඛ්‍යානමය විශ්ලේෂණය ශිල්ප ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය සිදු කරන ලදී . මෙම අධ්‍යනයේ අවසානයේ නිගමනය වූයේ විශ්වවිද්‍යාලය සතුව ප්‍රමාණවත් භෞතික මෙන්ම මානව සම්පත් ප්‍රමාණයක් පවතින බවත් නමුත් විද්‍යාර්ථීන්ගෙන් 30% ආසන්න ප්‍රමාණයක් මෙකී සම්පත් පිළිබඳ දැනුවත් භාවයෙන් නොසිටින බවයි. එසේම විද්‍යාර්ථීන්ගේ 50% පමණ සම්පත් පිළිබඳ දැනුවත් භාවයෙන් සිටියද එකී සම්පත්වලින් නිසි පරිදි ප්‍රයෝජන නොගන්නා බව පැහැදිලි වේ. තවද පර්යේෂණයේදි ඉදිරිපත්  වූ යෝජනා අතර සම්පත් උපයෝජනය වැඩි කිරීම සඳහා එම සම්පත් වෙත ප්‍රවේශ වීමේ ඉඩකඩ පුළුල් කළයුතු බව සඳහන් විය. මේ අනුව විශ්වවිද්‍යාලය සතු ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් ප්‍රමාණයක් තිබුණද විශ්වවිද්‍යාල විද්‍යාර්ථීයා එතුළින් නිසි පරිදි ප්‍රයෝජනය නොගන්නා බව පැහැදිලි වේ.

**මුඛ්‍ය පද :** භෞතික, මානව, විශ්වවිද්‍යාලය, සම්පත්

---

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ashanshalika008@gmail.com